# SriLankan Careers

www.srilankan.com

ශ්‍රී ලංකාවේ ජාතික ගුවන්සේවය සහ "**one**world" සංධානයේ සාමාජික වන "ශ්‍රීලංකන් " යුරෝපය, මැදපෙරදිග, අප්‍රිකාව, ඉන්දියන් උපමහද්වීපය, අග්නිදිග ආසියාව, ඈත පෙරදිග සහ ඕස්ට්‍රේලියාව ආවරණය වන පරිදි ගමනාන්ත ජාලයක් වෙත සිය සේවාවන් සපයනු ලැබේ.

පහත තනතුරු හරහා ශ්‍රීලංකන් ගුවන් සේවය සමඟ සම්බන්ධ වීමට ක්‍රියාශීලී තරුණයින් හට අවස්ථාව සැලසේ.

## රියදුරු තනතුර

ගුවන් භාණ්ඩ, ගමන් මලු සහ මගීන් ප්‍රවාහනය කරන වාහන / උපකරණ මෙහෙයවීම රැකියා දරන්නා සතු කාර්යයභාරය වේ.

**අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු අවම සුදුසුකම් -**

- 2022 මාර්තු මස 16 වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි වීම.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිට තිබීම.
- වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් සතු වීම.

## ගුවන්යානා යන්ත්‍ර උපකරණ ක්‍රියාකරු තනතුර

ගුවන් සමාගමේ ආරක්ෂාව සහ ක්‍රියා පටිපාටි වලට අනුකූලව නියම කර ඇති ප්‍රමිතීන් පවත්වා ගනිමින් ගුවන් තොටුපොළෙහි බිම් හැසිරවීමේ උපකරණ ක්‍රියාත්මක කිරීම රැකියා දරන්නා සතු කාර්යයභාරය වේ.

**අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු අවම සුදුසුකම් -**

- 2022 මාර්තු මස 16 වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි වීම.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් සමත්වී තිබීම.
- වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් සතු වීම.
- බර වාහන පැදවීම හෝ අදාළ බර උපකරණ හැසිරවීමේ වසර 03 ක සේවා පළපුරුද්ද තිබීම.

අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ඔබගේ අයැදුම්පත සමඟ අ.පො.ස. සා/පෙළ අධ්‍යාපන සහතිකය, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, වලංගු බර වාහන රියදුරු බලපත්‍රය සහ අදාල සේවා සහතික වල පිටපත් අමුණා, **ඔබ අයැදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ** සඳහන් කර පහත ලිපිනයට 2022 මාර්තු මස 16 වන දිනට පෙර අප වෙත ලැබෙන ලෙස යොමු කරන්න.

**කළමනාකරු, බඳවා ගැනීම් සහ ආයතනික සබඳතා,**
මානව සම්පත් අංශය,
ශ්‍රීලංකන් ගුවන් සමාගම,
ගුවන් සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ,
කටුනායක.

අප සියලු දෙනාහට සමව සලකන ආයතනයකි.

අනිසි බලපෑම් කිරීම ඔබ නුසුදුස්සකු වීමට හේතු වේ.

සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම්, අයදුම්පත් භාරගන්නා අවසන් දින සිට මසක් ඇතුලත ඒ පිළිබඳව ඔබ වෙත දැනුම් දෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණ සහ තෝරා ගැනීමෙන් පසු ක්‍රියා පිළිවෙත් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ නීති රීති හා රෙගුලාසින්ට අනුකූල වේ.

Company Registration No PB67

කළමනාකරු, බඳවා ගැනීම් සහ ආයතනික සබඳතා